# පුරාණ වැව් ගම්මානයක නායකත්වය හා සමාජ සංවිධානය තීරණය කිරීමෙහි ලා බලපෑ ප්‍රමුඛතම සාධකය "මරණාධාර සමිතිය" බවට පත් වූ අයුරු ...

ක්‍රි.පූ. 232 භාතියතිස්ස රජු සමය දක්වා දිවෙන ඓතිහාසික පසුබිමක් සහිත "පුල්එළිය ගම්මානය" පු+එළිය-පුල්එළිය වූ බවටත්, උපුල්+විල පසුව පුල්එළිය වූ බවටත් වන මත කිහිපයකි. පුරාණයේ රුවන්වැලි මහා සෑයට හා ජය ශ්‍රී මහා බෝධියට නෙළුම් මල් රැගෙන යාමේ දී මල් පුබුදු කරපු තැන පු+එළිය ලෙසත්, පසුව පුල්එළිය වූ බවටත් පැවසේ. එසේම, නෙළුම් මල් ගහන මෙම ගම්මානයේ වැව උපුල්+විල වූ නිසා පුල්එළිය වූ බවටත් මතයකි. කෙසේ වෙතත්, පුල්එළිය ගම දීර්ඝ ඉතිහාසයකට නෑකම් කියන අතර විජය රජු සමඟ පැමිණි පිරිවරගෙන් පැවත එන බව ගම්වැසියන්ගේ විශ්වාසයයි.

'පුල්එළිය', 1950 දශකය වන තෙක්ම ඉතා නො දියුණු මට්ටමේ පැවති ගමක් වන අතර එවකට ජනගහනය 200 ඉක්මවා නැති බවට සාක්ෂි ඇත. (ලීච්, ඊ.ආර්. 2003, 438 පිටුව) එද තිබූ නිවෙස් කිහිපය ද ළං ළංව පිහිටා තිබූ අතර එය 'ගංගොඩ' ලෙස හඳුන්වා ඇත. මෙකී පිරිස රාජ්‍ය මට්ටමේ නායකත්වයට වඩා සාම්ප්‍රදයිකව පැවත එන නායකත්වයට නැඹුරුව කටයුතු කර ඇති බව පෙනෙයි. ගමරාළ ගමේ ප්‍රධානියා වූ අතර වෙල් විදානේ, මොහොට්ටාල, රාළහාමි ආදී තනතුරු ඒ ඒ රාජකාරීවල දී මැදිහත් විය. මෙහි දී ප්‍රධාන ලෙසම කෘෂිකාර්මික කටයුතු සම්බන්ධ නීති රීති, නඩු හබ කෙරෙහි බලය යොදවා ඇත්තේ වෙල් විදානේ ය. එය ද ඇතුලුව ගම්මුන්ගේ සෙසු ගැටලු නිරාකරණය, සම්ප්‍රදයයන් හා උත්සව ආදියේ දී ප්‍රධානත්වය ගෙන ඇත්තේ ගමරාළයි. මෙකී තනතුරු දෙකටම ගමේ වැඩිහිටියන් විසින් පත් කරනු ලැබූ අතර ඔවුන්ගේ බලයට අන් සියලු දෙනාම දැඩි ලෙස අනුගතව කටයුතු කල බව පෙනෙන්නට තිබේ. එසේම, ඔවුන් කෙරෙහි වූ භක්තිය හා ගෞරවය තුළ ඔවුන්ට කිසි විටෙක අභියෝග කිරීමට ගම්මු නො පෙළඹුන හ. ගම තුළ සිටි අයගෙන් සියයට සියයක් ම පාහේ ඥාතීන් වීම ද මෙම ගම තුළ වූ විශේෂත්වයකි. මෙකී සම්ප්‍රදයික පැවැත්මට මෙම කාරණය ද එක් හේතුවක් වන්නට ඇත.

පසු කාලීනව මෙකී සම්ප්‍රදයික නායකත්ව ස්වරූපය තුළින් සමාජය සංවිධානය කිරීමට තිබූ ශක්‍යතාවය දුර්වල වූ ආකාරයක් පෙනෙන්නට තිබේ. ඊට ප්‍රධාන හේතුව වන්නේ බින්න විවාහ ක්‍රමයත් සමඟ ගමට සම්බන්ධ වූ පුද්ගලයන් තමන්ට අනන්‍ය පෞරුෂයක් ගොඩනහා ගනිමින් ගම තුළ නායකත්ව භූමිකාව ආක්‍රමණය කිරීම යැයි සිතන්නට කරුණු පැවතීමයි. අයෙක් තම ශරීර ශක්තිය මත අසාමාන්‍ය පුද්ගලයෙකු ලෙස සමාජයේ ඉස්මතු වීමට උත්සාහ දරා ඇත. මෙකී තත්ත්වය මත මොවුන්ට පුල්එළිය ගම තුළ සුවිශේෂ තැනක් හිමිව තිබූ බවට වන ප්‍රායෝගික අත්දැකීම මෙම ලේඛකයා සතු ය. මෙකී තත්ත්වය 1980 දශකය පමණ වන තෙක් අඩු වැඩි වීම් ඔස්සේ පැවතිණි. 1970 දශකයේ සිට නවමු සමාජ ආයතනයක් තුළින් සම්ප්‍රදයික නායකත්ව ස්වරූපය හා සමාජ සංවිධානයේ ස්වරූපය තීරණය් කිරීම ඇරඹිණි. එය මරණාධාර සමිතියයි.

වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මරණයක දී මරණයට පත් පුද්ගලයාගේ ඥාතීන්ගේ අසරණකම මැඩ, ද්‍රව්‍යමය හා මානසික උපකාර ලබාදීම මරණාධාර සමිතියක ප්‍රමුඛ කාර්ය වේ. ඉන් ඔබ්බට ගිය සමාජ භූමිකාවක් වර්තමානය වන විට මෙකී සමාජ

ආයතනය හරහා පුල්එළිය ජන සමාජ තුළ ස්ථාපිත වී ඇති බව නම් සත්‍යයකි. සමාජ සංවිධානයේ ස්වරූපය තීරණය කිරීම කෙරෙහි බලපා ඇති ප්‍රබලතම සාධකය ද මෙය බව පෙන්වා දිය හැකිය.

1975 දී ආරම්භ වූ එක්සත් මරණාධාර සමිතියේත්, පසුව ආරම්භ වූ උපුල් මරණාධාර සමිතියේත් ආරම්භය, විකාශනය හා කාර්යභාරය දෙස බැලීමේ දී උක්ත නාමික අර්ථයට වඩා සමාජ බලපෑමක් එමගින් සිදු කරන බව පෙනෙයි. පුල්එළියේ ගම්වාසීන්ගෙන් සෑම විවාහක පවුලක්ම මෙයින් කුමන හෝ මරණාධාර සමිතියක සාමාජිකයෙකුවීම විශේෂත්වයකි. මරණාධාර සමිතියක සමාජිකත්වය නො දැරීම සමාජමය වශයෙන් පිටතට තල්ලුවීමට බලපාන කරුණක් වේ. එසේම, මරණාධාර සමිතියේ ක්‍රියාකාරීත්වය මරණයක දී පමණක් නොව මහලක දී වැඩිවියට පැමිණීමේ උත්සවයක දී මෙන්ම පිංකමකදීත්, ගමේ පවතින සම්ප්‍රදායික සංස්කෘතිමය අවස්ථාවන්හි දී ත් ප්‍රමුඛ වේ. කෑම පිසීමට අවශ්‍ය හැලි-වළං, ටකරන් මඩුව, පුටු ආදී භෞතික සම්පත් සපයා ගැනීමට අනිවාර්යයෙන් මෙම සමිතියක සාමාජික විය යුතුය.

මරණාධාර සමිතිය තුළ නිළධාරීන් පත් කිරීම ප්‍රජාතාන්ත්‍රික ස්වරූපයක් ගන්නා බවට දර්ශනය වුවත් ඒ තුළ හඳුනාගත හැකි ක්‍රියාකාරී කණ්ඩායමක් සිටින බව පෙනෙන්නට තිබේ. ඔවුන්ගේ තීරණයන්ට එකඟ වනු හැර එයට අභියෝග කිරීමට බහුතරයකට නො හැකිය. ඒ ආකාරයේ සමාජ පිළිගැනීම්, සුළු පිරිසක් විසින් ආරෝපනය කර ගෙන තිබේ. එසේ බලපෑම් කොට සමිතියේ ප්‍රගමනය සාධනය කර ගැනීමට ප්‍රායෝගික හැකියාවක් නැත. ගම තුළ මරණාධාර සමිති දෙකක් බිහිවීම එයට කදිම නිදසුනකි. විවිධ මතයන් දැරීම හා පවත්නා ක්‍රියාකාරීත්වය විවේචනය කිරීම හරහා ඔවුන්ට පවත්නා සමිතියෙන් ඉවත්වීමට සිදු වී ඇත. අනතුරුව නව සමිතියක් පිහිටුවා පවත්වා ගෙන යන අතර මෙම සමිතිය තුළ ද යට කී අධිකාරීමය ස්වභාවය දක්නට ලැබේ. සාමාජිකයින් බොහෝමයක් තීරණ ගැනීමේ නො යෙදෙන අතර සුළු පිරිසක් ගනු ලබන තීරණවලට එකඟවීම සිදු වේ. මෙයට බලපා ඇති ප්‍රධාන සාධකය වන්නේ මරණාධාර සමිතිය තුළ නිලධාරීන් සමාජ නායකත්වය කෙරෙහි සුදුස්සන් බව හා එයට තමන් එකඟ වන මානසිකත්වය නොවේ ද?

මරණාධාර සමිති දෙක තුළ ම ණය ව්‍යාපෘතින් ද ක්‍රියාත්මක කරන අතර ප්‍රජාවේ බැංකුකරුවන් බවට ද මරණාධාර සමිතියේ නිළධාරීන් පත්ව තිබේ. මේ හරහා ද සමාජය වෙත නායකත්වය විධාරණය කිරීමට ඔවුන් සමත්ව ඇත. ණය ලබාදීම, ණය අය කර ගැනීම, ණය අය කර ගැනීමට කරන වාචික බලපෑම් හරහා නිතැතින්ම මෙකී නිළධාරීන් සමාජය තුළ නායකයින් බවට ස්ථාපිත වී ඇති අතර සෙස්සන් ඊට අවනත වනු දකිය හැකිය. ඒ නිසාම, මෙකී ප්‍රජාවේ සමාජ සංවිධානය හැඩ ගැසීමේ දී හා නායකත්ව ස්වරූපය සඳහා ප්‍රමුඛ සාධකය මරණාධාර සමිතිය බව පැවසීම යුක්ති යුක්ත වේ.

වැව් ගම්මානය තුළ පවත්නා ප්‍රධාන සංස්කෘතික අංගය වන්නේ මුට්ටි නැමීමේ මංගල්‍යයයි. සෑම අවුරුද්දකම ඇසළ මාසයේ මෙය පවත්වනු ලබයි. එය පුරාණයේ සිට පැවතෙන චාරිත්‍රයකි. අස්වැන්න නෙලාදීම වෙනුවෙන් වැවත්, වෙළත් කේන්ද්‍ර කොට ගනිමින් දෙවියන්ට ස්තුති කිරීමේ මානසිකත්වයෙන් කිරි ඉතිරවීම මෙහි දී සිදු වේ. මෙකී කාර්ය ඉටු කිරීම අනිවාර්ය වන අතර ඒ සඳහා ගමේ සියලු දෙනා සම්බන්ධ වේ. එසේ නො කිරීම දේව උදහසට පාත්‍රවීමට හේතුවක් බව සාමාන්‍ය මතයයි. මෙම කටයුත්ත ගමරාළ මූලික කොට ගෙන වෙල් විදනේගේ සංවිධානය යටතේ සිදු වූ කාර්යයකි. මේ වන විට පුල්එළිය තුළ මෙම කාර්ය සඳහා පෙරමුණ ගනු ලබන්නේ මරණාධාර සමිතිය වීම විශේෂත්වයකි. මෙහි දී වෙල් විදනේ සම්බන්ධ වුව ද, සංවිධානමය කටයුතුවල දී ප්‍රමුඛස්ථානය මරණාධාර සමිතියට අයත් වේ. සමිති දෙක

වසරක් හැර වසරක් මෙම වගකීම භාර ගනී. පුරාණයේ ගමරාළ නම් වූ සාම්ප්‍රදායික නායකත්වයට හිමි භූමිකාව මරණාධාර සමිතිය වෙත පැවරීම තුළින් ද පෙනී යන්නේ පුල්එළිය ගම තුළ සමාජ සංවිධානය තීරණය කිරීම හා නායකත්ව ස්වරූපය මරණාධාර සමිතිය විසින් ආක්‍රමණය කර ඇති ආකාරයයි.

පුරාණ සමාජය තුළ පොදු කටයුතුවලට සම්බන්ධ නොවීම තුළ වරිග සභා හෝ ගම් සභා හරහා දඬුවම් පැමිණවීමේ බලය ගමරාළ සතු ය. ඊට අභියෝග කිරීමට කිසිවකු සමත් නොවී ය. වර්තමානය වන විට එකී හැකියාව පවතින්නේ මරණාධාර සමිතියට වේ. මරණයක් වූ නිවසේ සියලු කටයුතු භාර වන්නේ මිය ගිය තැනැත්තා සාමාජිකත්වය දරන සමිතියට යි. සමිතියේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සාමාජිකයින් සියලු කටයුතුවල නිරත විය යුතුය. මෙය නීතිමය ස්වරූපයකට යටත් වේ. සුසාන භූමියේ කටයුතු, සැරසිලි, සංග්‍රහ කටයුතු ආදිය සඳහා වෙන වෙන ම පිරිස් තෝරා ගෙන ඇති අතර එය ඔවුන් ඉටු කරනවා ද යි සොයා බැලීමට නිලධාරියෙක් සිටී. එම කටයුතු පැහැර හැරීමෙන් දඩ මුදලක් අය කර ගැනීමට ද සමිතියට බලය ඇත. මේ ආකාරයෙන් නීතිමය ස්වරූපයක් කරා පුල්එළියේ පොදු සමාජ කාර්යයන් ද වෙනස් වී තිබේ. මේ සියල්ලේම තීරකයා වන්නේ මරණාධාර සමිතිය යි. මානුෂික හැඟීමෙන් එකී කටයුතුවලට සම්බන්ධ වනවාට වඩා සිදු වන්නේ තමන් සාමාජිකත්වය දරන මරණාධාර සමිතියේ නීතිමය රාමුව තුළ රැඳී සිටීම උදෙසා කටයුතු කිරීමකි. මේ හරහා අදාළ කාර්යයන් ඉටු වුව ද, පුරාණ ගම තුළ වූ සාමූහික මානුෂික හැඟීම් ගිලිහෙමින් පවතී. ඒ පුරාණ වැව් ගම්මානය තුළ වූ සම්ප්‍රදායික නායකත්වය හා සමාජ සංවිධානය කිරීමේ හැකියාව මරණාධාර සමිතිය වෙත විතැන්වීම හරහා සිදු වූ විපර්යාසයකි. තමන් කුමන හෝ මරණාධාර සමිතියක සාමාජිකත්වය දරන නිසාත්, සමිතිය මූලික වී තමන්ගේ නිවසේ වන මරණයක දී කටයුතු කරන බවටත් වන විශ්වාසය මත එකිනෙකා අතර වන සහයෝගී හැඟීම් යම් ආකාරයකට පලුදු වී ඇති බව ද සත්‍යයකි.

සාමාන්‍යයෙන් මරණාධාර සමිති තුළ නිලධාරී මට්ටමට යොමු වන පිරිස් ම සමිතියෙන් බැහැර වෙනත් කටයුතුවල දීත් ප්‍රධානත්වය ගනු පෙනෙයි. මඟුල් ගෙදරක දී සභාව ඇමතීම, රාජ්‍ය හෝ වෙනත් සංවිධාන සමඟ පවත්වන සබඳතාවල දීත් මෙම පුද්ගලයින් විශේෂයෙන් හඳුනා ගත හැකි වේ. සමිතියේ නිලය භාවිතා කිරීමත් බොහෝ අවස්ථාවල දී වෙනත් අයෙකු විසින් කරන පැහැදිලි කිරීමක දීත්, එසේම මරණාධාර සමිතියක නිලතල දරන්නන් තමන්ව වෙනත් අයෙකුට හඳුන්වාදීමේ දීත්, වෙනත් අයෙකු විසින් එකී නිලතල දරන්නන් හඳුන්වාදීමේ දීත් අදාළ නිලය අවධාරණයෙන් සඳහන් කිරීමට වැඩි කැමැත්තක් දක්වන බව ලේඛකයාගේ ප්‍රායෝගික අත්දැකීම යි. ඒ තුළින් ද පැහැදිලි වන්නේ පුල්එළිය ජන සමාජයේ නායකත්වය මරණාධාර සමිතිය හරහා ස්ථාපනය වී ඇති අන්දමයි. මේ සියල්ල විශ්ලේෂණය කිරීම තුළින් පෙනී යන්නේ මරණාධාර සමිතිය තුළ ක්‍රියාකාරී නිලය සමාජ තත්ත්වය විදහා පාන බවත්, එය අන් අය පිළිගැනීමට සූදානම් බවත් ය. ඒ තුළින් ප්‍රජාව වෙත නායකත්වය සැපයීමේ ඉඩ කඩ මෙන්ම සමාජ සංවිධානය කිරීමේ බලය ද ඔවුන්ට නිතැතින් ම හිමි වේ. පුරාණ වැව් ගම්මානයක් වන පුල්එළිය ගම තුළ වූ සාම්ප්‍රදායික නායකත්වය වෙනුවට සමාජ සංවිධානය කිරීමේ ප්‍රමුඛ ආයතනය බවට මරණාධාර සමිතිය පත්ව ඇති බව සඳහන් කරන්නේ එබැවිනි.

**කේ.බී.පී.ටී.එස්. තිලකසිරි**
**විමර්ශක**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය